Atten: Cheif L.O.

(74)

| | |
|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | |

දිනය<br>திகதி<br>Date. 29.04.2021

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**Human Rights Commission of Sri Lanka**

ලේකම්.

සෞඛ්‍ය අමාත්‍යාංශය.

පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත.

කොළඹ 10.

<u>කොවිඩ්-19 ආසාදනය හේතුවෙන් මියගිය පුද්ගලයන්ගේ මෘතදේහ ආදාහනය කිරීම සම්බන්ධවයි</u>

කොවිඩ්-19 වසංගතය හේතු කොට ගෙන රට මුහුණ දී සිටින අසීරු තත්වයෙන් බේරා ගැනීම සඳහා සෞඛ්‍ය අංශ දක්වන කැපකිරීම ඉතාමත් ප්‍රසංසනිය වන අතර. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කටයුතු කරන සියලුම නිලධාරි මහත්ම මහත්මීන් වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමු.

ජනතාවගේ යහපත වෙනුවෙන් කොවිඩ්-19 වසංගතය පැතිරයාම වැළැක්වීම සඳහා රජය සහ සෞඛ්‍ය අංශ වලට වරින් වර නොයෙකුත් තිරණ ගැනීමට සිදු වන අතර. එසේ තිරණ ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බව පැහැදිලිය.

ඒ අනුව කොවිඩ් ආසාදිතව මිය ගිය පුද්ගලයන්ගේ මෘතදේහ ආදාහනය කිරීම සම්බන්ධයෙන් ගෙන තිබූ තීරණය මුස්ලිම් ප්‍රජාව අතර ප්‍රශ්න සහගත කරුණක් බවට පත්ව ඇත. ඒ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාවටද පැමිණිලි ඉදිරිපත් කිරීමටද පෙළඹී ඇත. ඔවුන් මෙතෙක් පවත්වාගෙන ආ ආගමික චාරිත්‍ර වලට බලපෑමක් සිදුවන බැවින්. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් ලෙස සලකා පැමිණිලි රාශියකින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. එම පැමිණිලි අතුරින් එක් පැමිණිල්ලක පිටපතක් ඔබගේ අවධානය හා නිරීක්ෂන සඳහා මේ සමග යොමු කර ඇත.

ඕනෑම පුද්ගලයෙකුට තමාගේ ඉතා කිට්ටු ඥාතියකුගේ අභාවය ඉතාමත් ශෝචනීය වන අතර තම තමන් අදහන ආගමානුකූලව අවසන් කටයුතු සිදු කිරීම විශාල අස්වැසිල්ලක් වේ. එසේ ම මියගිය පුද්ගලයාගේ අවසන් කැමැත්ත අනුව හෝ ඔවුන්ගේ ආගමික විශ්වාසය අනුව මෙම අවසන් කටයුතු සිදු කර ගැනීමට ඉල්ලා සිටීම ඉතා සංවේදී කරුණක් වන අතර. එය මානුෂීය අවශ්‍යතාවයක් බව අප සියලු දෙනා පිළිගන්නා කරුණකි.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>தலைமைக் காரியாலயம்<br>Head Office | 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.<br>14, R.A.De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 2505541/74 | විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல்<br>E-mail | sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11- 2505580/81/82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2505575<br>1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

මෙම සියලු පැමිණිලි වලින් මූලික වශයෙන් ඉල්ලා ඇත්තේ, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින්ද අනිවාර්ය කර නොමැති පසුබිමක අපගේ සෞඛ්‍ය බලධාරීන් විසින් සියලු කොවිඩ්-19 ආසාදිතයින්ගේ මෘතදේහ භූමදානය කිරීමෙන් තොරව ආදාහනය කිරීමට පමණක් තීරණය කිරීමට හේතු කවරේද යන්නයි. ඒ පිළිබඳව මුස්ලිම් ප්‍රජාව දැනුවත් වීම වැදගත් වන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිගනී. එම කරුණු වලට අමතරව පහත සඳහන් කරුණු පිළිබඳව ද අවධානය යොමු කිරීම අවශ්‍ය බව නිරීක්ෂණය වේ:

01. යම් පුද්ගලයකු කොවිඩ් වෛරසය ආසාදනය වී මිය යෑමෙන් පසු එම පුද්ගලයාගේ මරණය කොවිඩ් වෛරසය ආසාදනයෙන් සිදු වූ මරණයක් බවට මරණ ලියාපදිංචි සහතිකයේ පැහැදිලිව දක්වන්නේ ද යන වග.

02. මෙම වසංගත තත්වය යටතේ මෘතදේහ ආදාහනය හා භූමදානය කරන්නේ ද යන තීරණය විද්‍යාත්මක කරුණු මත පදනම් ව ගත යුතු බව පැහැදිලි කරුණකි. එනමුත් අනිවාර්ය ආදාහනය පිළිබඳව මුස්ලිම් ප්‍රජාව තුළ පැනනැගී ඇති සංවේදිතාවයන් ආමන්ත්‍රණය කිරීම සඳහා සෞඛ්‍ය බලධාරීන් මේ දක්වා මුස්ලිම් ප්‍රජාවේ නියෝජිතයන් හා සාකච්ඡා පවත්වා තිබේද යන්නත් එසේ සිදු වී නම් එම සාකච්ඡා වලින් පසුව එළඹුණු නිගමන කවරේද යන වග.

ඉහත කරුණු පිළිබඳ සවිස්තර වාර්තාවක් 2020-05-06 දින හෝ ඊට පෙර මෙම කොමිෂන් සභාව වෙත විද්‍යුත් තැපැල මගින් (sechrcsl@gmail.com) ඉදිරිපත් කරන්නේ නම් මැනවි.

මෙම දැනුම් දීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාරව බව කාරුණිකව සලකන්න.

ලේකම්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත : සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්